මුසු මුහුණෙනි.

''ඔව් මල්ලී හෙට ඉවර කරනවා''මොහොමඩ් උත්තර දෙමින් මාළුපාන් මල්ල අතට ගත්තේය. එතනින් පාර පැන පොලිසිය ඉදිරියෙන් ගොස් එළවළු මාර්කට් එකට රිංගූ ඔහු හාල් කිලෝවක් සමග එළවළු ජාති දෙකක්ද මිලට ගත්තේ අතේ ඉතිරි මුදල් ගණන් කරමිනි.

''මොකද මොහොමඩ් අද රෑවෙලා... අපි මේ සුද්ද කරල යන්නයි හැදුවෙ'' බක්කියේ සුදු අයියා අසන්නේ බඩු කිරන ගමන්ය.

''දන්නැද්ද අයියා වැඩේ ඉවරයක් කරලා දාන්න එපායෑ'' රුපියල් සියයේ කොල දෙකක් දික්කරමින් මොහොමඩ් කීවේය.

''මේ පාර තොරණ හුඟක් උසයි නේද මල්ලී''එහා බක්කියේ වයලට් අක්කා අසන්නේ බක්කිය හෝදන ගමන්ය.

''මේ පාර එළකිරි වගේ නියමයි අක්කා..... අඩි එකසිය පනහක් විතර උසයි''''ගෞතමදාස මාස්ටර් ද කොහෙද ආර්ට් පාර දාල තියෙන්නෙ''.... මොහොමඩ් එතැනට පෙනෙන තොරණ් උඩ කොටස පෙන්වමින් කියයි.''මේ පාර උසම එක අපෙන් තමයි'' මොහොමඩ් නැවත උත්තර බඳියි.

''බුදු හාමුදුරුවෝ ඉඳගෙනද හිටගෙනද බං'' වයලට් අක්කා කොඳුනාරටිය දිග අරිමින් දිගු හුස්මක් පිට කළාය.

''අර බුදු රැස් මාලාව අතෙන්ට යන්නේ.... බුදුහාමුදුරුවෝ හිටගෙන''මොහොමඩ් බඩුමලු ටික එල්ලාගෙන එළියට බැස්සේ ''හෙට උදෙන්ම එන්න ඕනෙ සුදු අයියා'' යැයි කියමිනි. එතැනින් ළමා රෝහල ඉදිරිපිට බස් නැවතුම වෙත ගිය මොහොමඩ් එකසිය හැට හතර හිඹුටාන බසයට ගොඩවූයේ සිනහවද කටේ පුරවාගෙනය.

''මාරයි බස් එකේ අද එච්චර සෙනඟ නැහැ'' ඔහුට ඉබේටම කියවිණි. හිස් අසුනක වාඩි වූ ඔහු බඩු මලුදෙක කකුල් දෙකට සිරකර ගත්තේය.

''මොකද මල්ලී අද බඩු අඩු'' ඔහු කොන්දොස්තර වරයා ගෙන් ඇසුවේ සාමාන්‍යයෙන් මෙවැනි වෙලාවට එසේ නොවන නිසාය.
''කොහෙද අපේම එකෙක් කපාගෙන ගියානෙ,''

''ගඳයා'' කොන්දොස්තර කොල්ලා කීවේ මොහොමඩ් ඒ දේ කළා සේය.
''කොහාටද''? ඔහුගේ මුහුණෙන් එතරම් පිරියක් නැත.

''කොලොන්නාවේ තෙල් ටැංකිය ළඟට මල්ලී'' මොහොමඩ් තවත් මුදල් කොළයක් දික් කළේය. බසයෙන් බැසගත් මොහොමඩ් මඩ කඩිති පිරි පාරේ එහාට මෙහාට පනිමින් මීතොටමුල්ල වත්ත දෙසට පියමැන්නේ ඔහුගේ වචන වලින් කියතොත් ඇඟ ටිකක් රත් කර ගැනීමටයි. ඔහු ඒ සඳහා කවදත් ගොඩවන්නේ ලයනල්ගේ පොට් එක වෙතය. නීතිගත හා නොවන ඕනම සුරාවක් ඔහු ළග ඇත්තේ ස්කාගාර සංස්ථාවක් බඳුවය. කිසිවෙකු බිය නැතිව පොට් එකට රිංගන්නේ පොලිසියේ මහත්තුරු එකා දෙන්නාද එතැනට රිංගන හෙයිනි. එතනින් හොර අරක්කු වීදුරුවක් කටේ හලාගත් මොහොමඩ් ලුණු කැටයක් හපමින් ගෙදරට පියමැන්නේ තරමක් වෙරි මතිනි. ලෑලි ගෙවල් පේළිය දිගේ තම ගෙදරට රිංගූ මොහොමඩ් නන්දනී අක්කේ කියමින් බඩුමලු ටික බිම තැබීය.

නන්දනී අක්කා ගෙදර හිටියේ නැත. අංශභාග රෝගයෙන් ඔත්පලව ලෑලි ඇඳේ උඩුකුරුව නිසොල්මන්ව සිටින සමරෙ අයියා කඩා වැටුණු පිළිමයක් සේ ඔහු දෙස බලා සිටී. නැවතත් කුඩා උළුවස්සෙන් ඔළුව එළියට දැමූ මොහොමඩ් ගෙදර දෙසට දුව එන දරුවන් දිටීය. එයින් දරුවන් දෙදෙනෙක් නන්දනී අක්කාගේ වන අතර, දියණිය හිමිවන්නේ මොහොමඩ්ගේ ලෙයින් මල්කාන්තිට දාව උපන් දරුවෙක් ලෙසිනි.

''මොහොමඩ් මාම දැන්ද ආවේ'' පිරිමි දරුවන් දෙදෙනා දියණිය ද සමගින් ගෙට රිංගුවේය.
''මෙන්න උඹලට මාළුපාන් ගෙනාවා,

කාපල්ලා........ අම්මටත් එකක් තියපං, උඹලගේ තාත්තටත් එකක් ඇති''වෙරිමත නිසා මොහොමඩ්ගේ මුවින් හරියට වචන පිටවෙන්නේ නැත. මාළුපාන් අතට ගත් තිදෙනා විමසන්නේ තොරණ ගැනය.
''කවුද තාත්තෙ මෙදා පාර ලයිට්'' දියණිය අසන්නේ මාළුපාන් ගෙඩිය මුවට ඔබමිනි.

''ආරියදාස ලයිට් බං.''''එහෙනම් මාමෙ නියෙමෙට ඇති'' මොහොමඩ් හිස වනයි.

''මොකක්ද මාමෙ මෙදා පාර ජාතක කථාව'' තවත් දරුවකුඅසයි.''මං දන්නෑ මලිංගො'' මොහොමඩ් ඇස් තරමක් පියවෙයි.

''අයියෝ, තොරණ් මාම කිව්වට වැඩක් නැහැනේ'-'පොඩි එවුන් එසේ කී විටම බාගෙට වැසීගිය මොහොමඩ්ගේ ඇස් තරමක් ලොකුවිණි.''චුල්ලන් පද්මෙ ජාතකේද කොහෙද බං ''

''අනේ තාත්තේ මේ සැරේ අපි ඔක්කොම තොරණ් ටික බලමු'' දියණියගේ කටට කැඩී ගිය මාළුපාන් ගෙඩියේ සිදුරෙන් අල කෑල්ලක් වැටෙන්නට ආසන්නය

.''අනේ මාමේ ඒ කථාව කියන්නකෝ''

''මං දන්න පදුමයක් නැහැ බං, ආරි මාමගෙන් අහගෙන ඇවිල්ල කියල දෙන්නම්'' මොහොමඩ් කීය.

මොහොමඩ් මේ වත්තට ආවේ ඉතා කුඩා කාලයේදීමය. පියෙකු නොමැතිව මව් හව්හරණයේ උස්මහත් වූ මොහොමඩ් පාසල් ගොස් ඇත්තේ හයේ පන්තියට යනතෙක් පමණි. සිංහල භාෂාවෙන් අධ්‍යාපනය ලද මොහොමඩ් ඒ කාලයේ පල්ලි ගොස් යාඥා කළහැටි තවමත් මතකයේ යන්තම්ව පවතී. එදාවේල සොයා ගනිමින් මව සමග ජීවිතය ගැටගසා ගත් මොහොමඩ්ගේ දිවියේ වෙනසක් ඇති වූයේ මල්කාන්ති සමග යුග දිවිය ඇරඹීමෙන් පසුවය. ඊට පසු ඔහු පල්ලි වෙනුවට මල්කාන්ති සමග පන්සල් ගියේය. කාලයක් සතුටින් සිටි ඔවුන්ගේ කැදැල්ලට දියණිය ලැබීමෙන් පසු ඇතිවූ අඟ හිග මැද, රණ්ඩු සරුවල් වී ජීවිතය දෙදරා යාමට පටන් ගත්තේය.

මොහොමඩ්ගේ ප්‍රථම ආදර ලෝකය එසේ දෙදෙරා ගියේ මොර සූරන වැස්සකට, ගහකට පාත්වුන හෙණයක් මෙනි. තමාට වඩා වැඩි මහළු නන්දනී අක්කාට මොහොමඩ් ලං වූයේ ඉන් පසුවය. අංශභාගෙ රොගය වැළදී මොළය අප්‍රානික වූ නන්දනීගේ සැමියා සහ දරුවන් සමග මොහොමඩ්ගේ දියණියද අද වෙසෙන්නේ එකම නිවසේය. නන්දනී අක්කා සමග අහල පහල කවුරුන් හෝ රණ්ඩුවක් ඇතිවුන විට පිටවෙන කුණු කතාවක් මිසක්, මේ සම්බන්ධතාවය ගැන වත්තේ මිනිසුන්ටද ප්‍රශ්නයක් වී නැත.'

'මාලිංගො පබා යනවෝ''කුසුමලතා අක්කාගේ පුතාගේ කටහඬ ඇසුනු දරුවෝ ''මාමේ අපි පබා බලල එන්නම්..'' කියා එළියට බැස දුවන්නට වූහ. මැද පෙරදිග කාලයක් ගතකළ කුසුමලතාගේ විශාල රූපවාහිනී තිරය නැරඹීමට අහල පහල කීප දෙනෙකුද එදෙසට දිව ගියෝය.

''අනේ මල්ලියේ උඹ දැන්ද ආවේ.... මං මේ මනුස්සයගේ බේත් ටික ගන්න ගියා'' නන්දනී අක්කා ගෙට ගොඩවුනේ හති අරිමිනි.

''නැහැ දැන් ටිකක් වෙලා''පුටුවට ඇලවී ඔළුව ලෑලි පළුවට හේත්තු කර බාගෙට නිදියමින් මොහොමඩ් පිළිතුරු දෙයි.

''කෝ මල්ලි ළමයි''''උන් ගියා බබෝද මොකක්ද බලන්න... අන්න උඹට මාළුපාන් ගෙඩියක් ඇති.''''මං ඉඳියාප්පන් ටිකක් ගෙනාව මල්ලියේ සමෙරෙ අයියට කවන්න''අනෙක් කාමරයට රිංගා ගත් නන්දනී ඇඳුම් මාරු කිරීමට පටන් ගත්තාය. කාමරයක් කිව්වද එකම ගෙයි එය වෙන්කර ඇත්තේ හරහට ලණුවක් ඇදි තිර රෙද්දකිනි. රෙද්ද මෑත්කර එයට රිංගූ මොහොමඩ් ගොස් ඇගේ බඳවටා අත යැවීය.

''පිස්සුද බං මල්ලියේ, දහඩිය ගඳේ බැහැ'-'එහෙත් මොහොමඩ්ගේ ආලවන්ත ග්‍රහණයෙන් ඇයට මිදීමට නොහැකිය.

''දැන් පොඩි එවුන් ටික එයි මල්ලියේ''නන්දනී අක්කාගේ ස්වරය පහත්ය. මොහොමඩ් ඇය තව තවත් ළං කර ගත්තේය. විනාඩි කිහිපයක් ගෙවී ගියේය. හැට්ටය තදකර පැදුරෙන් නැගිට ගත් ඇය කොණ්ඩය උඩට වෙන්නට ගෙඩියක් ලෙස බැඳ ගනිමින් දොර පළුව විවර කර ඇවිත් සමරෙ අයියා දෙස බලා සිටියේ දුකින් පිරි හදවතෙනි. ඔහු නිසොල්මන්ව තම අප්‍රානික සිරුර හා මනස සමගින් මළකඩ බැඳුණු තහඩු වහළය දෙස බලා සිටියේ දුකද කඳුලද නොහඳුනන නිසාය.

''අනේ මල්ලියේ සමරෙ අයියව හෝදන්න ඕනෙ'' නන්දනී අක්කාගේ අත්වාරුව ඇතිව සමරෙ අයියා දෝතට ගත් මොහොමඩ් සමරෙ අයියා මිදුලට ගෙන නන්දනී අක්කා ගෙනත් දුන් වතුර බාල්දියෙන් ඔහු නාවන්නට වූයේය. සමරෙ අයියාට සරමක් අන්දවා කබල් ලෑලි ඇඳ උඩ තැබූ මොහොමඩ් ඔහුගේ දෑතින්ම සමරෙ අයියාට කඩයාප්පන් කැව්වේය.ඊළඟ දිනයේ හිරිමා උදයේ මොහොමඩ් තොරණ ලගට යන විට කට්ටිය ලක ලෑස්ති වී සිටියේ පින්තූර රාමු සවි කරන්නටය.

''චුල්ල පදුම ජාතක කථා වස්තුව'' විශාල රූප රාමුවක රවුම් අකුරෙන් පුන් කලස දෙකක් මැදින් ඇඳ ඇති අකුරු පෙළ ඔහු හයියෙන් කියෙව්වේය.'

'ආරි අයියා මේ කතාව මොකක්ද බං, ළමයින්ගෙන් බේරෙන්න බැහැ, කතාව අහනවා''

''යකෝ උඹ මේ කතාව දන්නෙ නැද්ද, අර බයිල එකකුත් තියෙන්නෙ. අර බිසවට කාන්තාරෙ මැද්දෙ වතුර තිබහ හැදිල රජතුමාගේ ඇගේ ලේ බොන්න දුන්නෙ බං'' ආරි අයිය කතාව කෙටියෙන් කියවයි.''-අන්තිමේදී බිසව කොටාට ආස හිතිල ඌත් එක්ක පැනල යනව''



''බිසව මාර මෙ-ඞ්ඩියෙක්නෙ ආරි අයියා, කකුල් තියෙන එවුන් දාලා කකුල් නැති එවුන් එක්ක පැනල යනවා''මොහොමඩ්ට පුදුමය.'-'කරුමෙට ඇස් නැහැනෙ බං,'' ආරියපාල අයියා කියයි. ''උරේ පලල ලේ නුදුන්නට මමත් මල්කාන්තිට කොච්චර ආදරේ කළාද ආරි අයියා'' මොහො මඩ්ගේ ඇස්වල කඳුළුය.''හැම ගෑනිම එහෙම නෑ බං... අනෙක උඹට දැන් ආදරේ කරන්න එක්කෙනෙක් ඉන්නවනේ''

''නන්දනී අක්කට ආදරේට වැඩිය මට තියෙන්නෙ අනුකම්පාවක් ආරි අයියා,.. මං නැත්නම් උන් ටික ජීවත් වෙලා ඉවරයි''

''මං ඒකෙ වරදක් කිව්වෙ නෑ බං,...... අනෙක මේ කතා ගැලපෙන්නෙ රජ කාලේ වගේම මේ කාලේ සල්ලි යහමින් ඇති එවුන්ට, මේවා අපිට ගැලපෙන්නෙ නෑ බං''උඹලට, අපේ ගෑණුන්ට, චින්චමානවිකාවෝ වෙන්න වෙලා තියෙන්නෙ ජීවත් වෙන්න'' ආරි අයියා කියාගෙන යන්නේ මොහොමඩ්ගේ සිත සනසවන අටියෙනි.මොහොමඩ් ආරි අයියාගෙන් කතාවේ ඉතිරි කොටසද අසා දැනගත්තේ රෑට ගොස් පොඩි එවුන්ට කියාදෙන අදහසිනි.

''දැන් ඉතින් වැඩේට බහිමු. රෑට ලයිට් හයි කරන්න තියෙනවා'' එදා රාත්‍රියේද ලයනල්ගේ පොට් එකෙන් හොර අරක්කු වීදුරුවක් කටට හලා ගත් මොහොමඩ් දරුවන්ට කතාව කියා පාන්නේ වචන පටලවමින් වරද්දමිනි.

''බිසව කැරකුණා රජ්ජුරුවෝ පුෂ්ගාල තල්ලු කළා''

''හුඟක් පහළටද තාත්තෙ''ඒක මං දන්නෑ..... රජ්ජුරුවෝ මැරෙන්නෙ නෑ බං ...''යන්තම් ෂේප් වුණාලු මාර චාන්ස් එක''
''මාරයිනෙ මාමෙ, පොඩි කන්දක් වෙන්න ඇති''

''තාත්තේ එහෙම උරේ පලල ලේ දුන්න නම් ලේ ගිහිල්ලම මැරෙනවා'' පොඩි එකක් කියයි.අපේ තාත්තගෙ ඇගේ ඔච්චර ගලාගෙන යන්න තරම් ලේ නැහැ.

''පිස්සුද''... මොහොමඩ්ගේ දියණිය කියයි.

''උන් රජ්ජුරුවොනෙ බං, රජවරුන්ගේ බොඩිවල හුගක් ලේ තියෙනවා'' මොහොමඩ් ඇගේ වැසූ මදුරුවා තලා දමමින් පැවසුවේය.

''අනේ තාත්තේ අපි සමරෙ මාමවත් මේ සැරේ වෙසක් බලන්න එක්කගෙන යමු''''සමරෙ මාමට දැන් වෙසක් ගැන තේරුමක් නැහැ බං''

''ලයිට් දිහා බලන් ඉඳියිනෙ මාමෙ''......... අපි අර ගෑස් සිලින්ඩර් දාගෙන යන බොරේෂර් රෝද කරත්තෙ දාගෙන තල්ලු කරන් යමු''

''හොඳයි බලමුකෝ'' මොහොමඩ් ඇස් කසමින් කීවේය.

වෙසක් දින රාත්‍රියේ විසිතුරු බලන්නට පොඩි එවුන්ට ඉවසුමක් නැත. සමරෙ අයියා බොරේෂර් රෝද කරත්තේ උස්සා තබාගත් මොහොමඩ් දරුවන්ද, නන්දනීද සමග බොරැල්ල පැත්තට ඇදී ගියේ අවට දන්සැල්ද වඳිමින්ය. බොහෝ වේලාවට කරත්තය තල්ලු කළේ මොහොමඩ්ය. බොරැල්ල තොරණ දුටුවිට ඔහුගේ හිතට දැනුනේ විශාල සතුටක් මෙන්ම ආඩම්බර කමකි. මධුර හඬින් දුක් ගීයක් ගයන ගායිකාවකගේ ගීතයක් කතාව අතර මැදින් ගලා යයි. නන්දනී අක්කා එය අසාගෙන සිටින්නේ බොහෝ දොම්නසෙනි. දරුවෝ විදුලි බුබුළු දෙස බලා එහි විහිදෙන ආලෝකයෙන් ප්‍රීතියෙන් කුල්මත් වී සිටියි. සමරෙගෙ ඇස් දෙක පියවී ඇත. ඔහුගේ නෙත් විවර වුනද පෙනෙන්නේ සඳ පායා ඇති අහසය. කරත්තයේ පැත්තට ඇලවී නිදි සුව විඳී ඔහුගෙන් සිහින් ගෙරවිලි හඬක් පිටවෙයි. තොරණේ කතා නාදයෙන් එය යටපත් වී ඇත. සමරෙ අයියා අසලින්ම වාඩිවූ මොහොමඩ් ඔහුටම මුවා වී සිගරට්ටුවක් දල්වාගත්තේ නිදිමත වලක්වා ගන්නටය.

*2009 වසරෙ ගොඩගේ සාහිත්‍ය සම්මාන උළෙලේ අවසන් වටයට තේරුණු ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ පරමේශ්වරී සහ වෙනම රටක් කෙටිකතා සංග්‍රහයෙනි*

දෙවනුව අප දුරකථනයෙන් සම්බන්ධ කරගත්තේ විශාරද දීපිකා ප්‍රියදර්ශනියයි.

"විශාරද නන්දා මාලනී මිස් එක්ක ප්‍රසංගයක් කරමු කියලා ධනුෂ්ක මගෙන් කරපු ඉල්ලීම අහක දාන්න බැරි වුණා, ඒකට හේතු ගණනාවක් තියෙනවා," දීපිකා ප්‍රියදර්ශනිය අප හා පිළිසඳරට එක් වූයේ එලෙසින්.

"මගේ සංගීත ගුරුතුමියත් එක්ක අපි දෙන්නා විතරක් කරන ප්‍රසංගයක් කරන මුල් වතාව මේ. ඒක මගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවක්. නන්දා මාලනී මිස් ආවට ගියාට දේකට කැමති වෙන කෙනෙක් නෙවෙයි. ඇය දන්නවා මේ ක්ෂේත්‍රය වෙනුවෙන් මා කරපු කැපකිරීම්. ඒ නිසා වෙන්න ඇති ධනුෂ්කට ඇය කැමති වෙන්න ඇත්තේ මා එක්ක මේ විදිහේ ප්‍රසංගයක් කරන්න. ඒක මට විශාල සතුටක්. මේක ඇත්තටම ලංකාවේ ඉන්න අයටවත් දකින්න නොලැබුණ අවස්ථාවක්. සමහරු ලංකාවෙත් මෙහෙම දෙයක් කරමු කියලත් යෝජනා කළා."

"අනිත් එක තමයි, ශ්‍රී ලංකාවේ ඉන්න "නයිටිංගේල්" තමයි නන්දා මාලනී මිස්. මම ඉස්සර "සත්‍යයේ ගීතය" ප්‍රසංගයේ ගීත කටපාඩමින් ගැයුවා. ඒ අපි කුඩා කාලයේ. එදාට සෞම්‍ය රාත්‍රියේදී මම ඇය සමග ගායනා කරනවා. මොන තරම් වටිනවද? රසිකයින්ටත් ඒක චමත්කාර අත්දැකීමක් වේවි."

"ධනුෂ්කගේ ඉල්ලීම තුළම පෙනෙනවා හොඳ යමක් කරන්න තියෙන උනන්දුව. ඒක ප්‍රතික්ෂේප කරන්න කිසිම හේතුවක් නෑ. අපි දැන් ඕස්ට්‍රේලියාවට එන්නේ ගෙදර යනවා වගේ හරිම බැඳීමකින්. ඩී. ඩී. ගුණසේන වගේ ප්‍රවීණයෝ එක පැත්තක. කලිඳු වීරසිංහලා, චරිත දිසානායක ඔයාලා වගේ හිතවත්තු තව පැත්තක. ඇත්තටම එකට බැඳුන සංගීත පවුලක් වගෙයි මට හිතෙන්නේ. ඉන්ද්‍රජිත් මිරිහාන සංගීතයෙන් වගේම ශබ්ද පරිපාලනයෙනුත් හපන්කම් පාන දක්ෂයෙක්. ඉතින් ලෝකයේ වෙන රටවල් වල කරන ප්‍රසංග අතරේ ඕස්ට්‍රේලියාවේ පැවැත්වෙන ප්‍රසංග තමයි සාර්ථකවම කෙරෙන්නෙ."

"ඒ කාලේ විශාරද මාලනී බුලත්සිංහල ශිල්පිනියන් එක්කත් මේ වගේ ප්‍රසංග 8ක් විතර සාර්ථකව කළා. ඒ වුනත් "සෞම්‍ය රාත්‍රිය" මටත් අළුත් අත්දැකීමක් වේවි. ඒ වගේම අපේ රසික හිතවතුන්ටත් නැවුම් අත්දැකීමක් වේවි. ඉතින් අපි එදාට "සෞම්‍ය රාත්‍රියේ"දී හැමෝම හමුවෙන්න බලාපොරොත්තු වෙනවා ඒ අත්දැකීම අපිත් එක්ක බෙදා හදාගන්න," දීපිකා ප්‍රියදර්ශනී විශාරදවරිය සිය පිළිසඳර නිමා කළාය. අපි ඇයට තුති පිදුවෙමු.

අප අතර වෙසෙන ධනුෂ්ක ප්‍රනාන්දු කලා හිතකාමී සහෘදයා මූලිකව සංවිධානය වන "සෞම්‍ය රාත්‍රිය" ජුනි මස 13 දා සවස හයට රිංවුඩ් හි ජෝර්ජ්වුඩ් පර්ෆොර්මිං ආර්ට් සෙන්ටර් ශාලාවේදී පැවැත්වෙයි. පෙර මෙන්ම මෙවර ද තවත් වෙනසක් ඇතිව ප්‍රසංගය ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති බවත්, ප්‍රසංගය නැරඹීමට පැමිණෙන ලෙස සියලු දෙනාටම ආරාධනා කරනා බවත් ධනුෂ්ක පැවසීය.